**Embassy of the United States of America**
**Colombo**

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: ohararm@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170825

## ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය ශ්‍රී ලංකා රේගු නිලධාරීන් සඳහා අනතුරුදායක භාණ්ඩ හඳුනාගැනීම සඳහා වූ පුහුණු වැඩසටහනක් පවත්වනු ලබයි

**අගෝස්තු 25 කොළඹදීය** ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අපනයන පාලන සහ දේශසිමා ආරක්ෂාව පිළිබඳ වැඩසටහන (EXBS) විසින් ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් 33 දෙනෙක් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණි. මෙම පුහුණුව 2017 අගෝස්තු 21 සිට 25 වැනි දින දක්වා කොළඹ දී පැවැති අතර එය සම්බන්ධීකරණය කරන ලද්දේ අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂණ වැඩසටහන මගිනි.

වැඩි අවදානමක් පවත්නා නැව් භාණ්ඩ තොග හඳුනාගන්නා ආකාරය සහ ලේඛන විශ්ලේෂණය මගින් එවැනි භාණ්ඩ ඉලක්ක කරගන්නා අයුරු පිළිබඳව ඉගෙන ගැනීමට මෙහිදී සහභාගිකයින්ට අගනා අවස්ථාවක් උදාවිය. භාණ්ඩ මෙරටට පැමිණීම, නැවත නැව්ගත කිරීම හා දේශසීමාවන් ගෙන් පිටතට යාම පරීක්ෂා කිරීමේදී රේගුඅංශ විසින් නියමිත උපකරණ හා සම්පත් උපයෝගී කරගනු ලබයි. මෙම පුහුණු වැඩසටහන මගින් සහභාගිකයින්ට ජාතික ආරක්ෂාවට හෝ මහජන ආරක්ෂාවට අවදානමක් ඇතිවිය හැකි භාණ්ඩ හඳුනාගැනීම පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවිය. මේ අනුව ඔවුන්ට භෞතික වශයෙන් වඩාත් හොඳින් පරීක්ෂා කිරීමට අවශ්‍ය වන නැව් භාණ්ඩ පිළිබඳව නිවැරදිව තක්සේරු කරගැනීමට හැකිවනු ඇත.

අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂක වැඩසටහනේ (EXBS) අරමුණ වන්නේ මහත් විනාශයක් සිදුකළ හැකි ආයුධ ප්‍රචලිත වීම වැළැක්වීමත් කළාපීය සාමය සහ ස්ථාවරත්වයට තර්ජනයන් වන්නාවූ සාම්ප්‍රදායික අවි භාවිතය නවතාලීමත්ය. අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂණ වැඩසටහන අවිභාවිතය ප්‍රචලිත වීම වැළැක්වීම සඳහා ක්‍රමෝපායයන් ගණනාවකින් අනුගමනය කරනු ලබයි. වෙළඳාම පාලනය කිරීම, බලපත්‍ර ලබාදීම සහ නීත්‍යානුකූල /නියාමන ක්‍රියාමාර්ග සඳහා තාක්ෂණ සහයෝගය ලබාදීම හා වරාය, දේශසීමා සහ නීතිය ක්‍රියාවට නැංවීමේ නිලධාරීන්ට පුහුණු සහ උපකරණ ලබාදීම ආදිය මෙයට ඇතළත්වේ.

###